# අම්බලන්තොට පලදාවර්ධන කමිටුව සහ ලංකා බැංකු ශාඛාව

***********************************

1976 - ? - 3

ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

114, විජේරාම මාවත

කොළඹ 7.

1975 ජනවාරි 17

## අම්බලන්තොට පලදාවර්ධන කමිටුව සහ ලංකා බැංකු ශාඛාව

අම්බලන්තොට පලදාවර්ධන කමිටුව 1973 අවසාන භාගයේ දී පිහිටුවන ලදී. මෙම කමිටුව යටතට ගොවි කාරක සභා 21 ක් අයත් වේ. කමිටුව මගින් ප්‍රදේශයේ ගොවීන් ගේ ප්‍රයෝජනය සඳහා රසායන පොහොර වර්ග ද, කෘෂි රසායන ද්‍රව්‍යයන් ද විශාල වශයෙන් අලෙවි කරනු ලැබේ. මෙම ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිති මගින් පොහොර සහ කෘෂි රසායන ද්‍රව්‍යයන් අලෙවි කරනු ලබන බව සත්‍යයකි. එහෙත් පලදා වර්ධන කමිටුවේ අදහස අනුව එම සමිති මගින් පොහොර ආදිය ලබා දීමේ දී නොයෙක් ප්‍රමාදයන් හා දුර්වලකම් ඇති බව පැවසේ. සියළු අවස්ථාවට පොහොර හෝ කෘෂි රසායන ද්‍රව්‍යයන් ලබා ගැනීමට නො හැකි වීම නිසා බොහෝ විට ගොවි මහත්වරුන්ට අපහසුකම් මෙන් ම අලාභ ද සිදු වේ. මේ නිසා විශේෂයෙන් වී නිෂ්පාදනය වැඩි කර ගැනීමට දරණ ජාතික ප්‍රයත්නයට රුකුලක් දීම වශයෙන් ද; පළාතේ ගොවීන් ගේ යහපත සඳහා ද, පොහොර ආදිය ගබඩා කොට විකිණීමට පලදා වර්ධන කමිටුව තීරණය කළ බැව් පෙනේ.

පලදා වර්ධන කමිටුව විසින් තෙල් ඉසින යන්ත්‍ර කිහිපයක් ද මිළ දී ගෙන ගොවි මහතුන් ගේ ප්‍රයෝජනය සඳහා යොදනු ලැබේ. පොහොර ආදිය විකිණීමෙන් 5% ක කොමිස් මුදලක් ද අය කර ගන්නා මෙම කමිටුව නමින් 1975 ජනවාරි මස වන විට රුපියල් 27,000/= ක පමණ මුදලක් ලංකා බැංකුවෙහි තැන්පත් ව තිබිණි.

ප්‍රතිසංවිධානය කරන ලද ගොවි කාරක සභා තවමත් මෙම ප්‍රදේශයෙහි පිහිටුවා නො මැත. මෙම ගොවි කාරක සභා වලට අලුතෙන් පත් කළ යුතු පුද්ගලයන් ගේ නම් දැනට යෝජනා කර ඇති බවත්, ළඟදී ඔවුන් පත් කළ හැකි බවත්, ප්‍රකාශ විය. පැරණි ගොවි කාරක සභා සමඟ මෙම කමිටුව තවදුරටත් කටයුතු කරන අතර, එවැනි සභා කිහිපයක කෘෂි කාර්මික සැලසුම් සකස් කොට ක්‍රියාත්මක කිරීමට අදහස් කරන බව පෙනේ. පැරණි ගොවි කාරක සභා වලට සාමාජික පිරිස ප්‍රදේශයේ කෘෂි කාර්මික කටයුතු තවදුරටත් දියුණු කිරීම සඳහා මෙම අවදියේ දී උපරිම උද්යෝගයෙන් ක්‍රියා නො කරන බවට පලදා වර්ධන කමිටු උප සභාපති මහතා ගේ අදහස විය.

ප්‍රදේශයේ ගොවීන් අතර පැවති ඉඩම් අරගල විසඳා ගැනීමට ඔවුන් බොහෝ විට පලදා වර්ධන කමිටුවේ මැදිහත් වීම බලාපොරොත්තු වේ. මෙවැනි අරගල 200 ක් පමණ කමිටුව විසින් විභාග කොට දෙපක්ෂයේ එකඟත්වය ලබා සමතයකට පත් කර ඇත. මින් සමහර ගැටළු අවුරුදු 10 කට ද වැඩි පැරණි පසුබිමකින් යුත් අරගල බව පැවසින. සිරිතක් වශයෙන් සෑම මසකම 15 වැනි දින පලදා වර්ධන කමිටු රැස්වීමක් පැවැත් වේ. එදින එක් වරුවක ප්‍රදේශයේ සියළු ගොවි කාරක සභා සාමාජිකයන්ට ද, පලදා වර්ධන කමිටු සාමාජිකයන් සමඟ එක්ව රැස් වී ගැටළු නිරාකරණය කර ගැනීමට ද, සැලසුම් සකස් කර ගැනීමටත් ප්‍රගති සමාලෝචනයටත් අවස්ථාව සලස්වා ඇත. බොහෝ ගොවි කාරක සභා සාමාජිකයින් මෙම අවස්ථාවෙන් ප්‍රයෝජන නො ගන්නා බව ප්‍රකාශ විය. නව ගොවි කාරක සභා සකස් කළ පසුව මීට වඩා උද්යෝගයකින් කටයුතු කරනු ඇතැයි සලකනු ලැබේ.

දැනට මෙම ප්‍රදේශයේ ගොවීනට ගොවි හැඳුනුම් පත් 670 ක් පමණ නිකුත් කොට ඇත. මෙම හැඳුනුම් පත් ලබා ගැනීම සඳහා ගතයුතු පියවර පිළිබඳ විස්තර ප්‍රචාරය කරන ලෙස ගොවි කාරක සභා වලින්, පලදා වර්ධන කමිටු විසින්, ඉල්ලා සිටින ලදී. කමිටුව විසින් ද ශබ්ද විකාශන යන්ත්‍ර මාර්ගයෙන් මෙම කරුණ පිළිබඳව ගම්වල ප්‍රචාරය දෙන ලදී. ගොවි මහතෙක් ගොවි හැඳුනුම් පතක්

සඳහා ඉල්ලුම් කළ දිනයේ සිට සාමාන්‍යයෙන් එක් මසක් ගත වූ තැන, හැඳුනුම් පත් ලබා ගත හැකි බව ප්‍රකාශ විය.

කෘෂි සේවා මධ්‍යස්ථානයේ සිතියකට දින 2 ක් වත් කටයුතු කරන්නට වාරිමාර්ග වැඩ භාර නිලධාරී මහතෙක් නො සිටීම පාඩුවක් බව පලදා වර්ධන කමිටුවේ උප සභාපති මහතා විසින් දන්වා සිටින ලදී. වාරිමාර්ග පිළිබඳ පැන නගින ප්‍රශ්න ලිපි ලේඛන ඉදිරිපත් කොට කල් ගත වී විසදා ගත හැකි ප්‍රශ්න නොවේ. ගොවි මහතෙකුට තම කුඹුරට වතුර ලබා ගැනීමට නියමිත අවස්ථාවේ දී තමාගේ වාරයෙන් ප්‍රයෝජනය ලබා ගත නො හැකි පරිදි යම් යම් ගැටළු ඇති වූ විට ඒවා කඩිනමින් විසදා - ගැනීමට, තීරණ හා පියවර ගත හැකි නිලධාරීන් පලදා වර්ධන කමිටුවට සහයෝගය නො දෙන්නේ නම් ගොවි ගැටළු කාර්යක්ෂමව විසඳිය හැකි නොවේ. මෙය පලදා වර්ධන කමිටුවේ අදහස විය.

සමහර විට ඉඩම් හිමියන් විසින් අඳ ගොවීන් අස් කිරීම වැනි අවස්ථා වල දී පලදා වර්ධන කමිටුව විසින් ගන්නා තීරණ පොලිස් අධිකාරීන් වෙත දන්වා යවන අතර, ඔවුන් ගේ සහයෝගය හා එකඟත්වය ලැබේ නම් මෙම ගැටළු සාධාරණ ලෙස බේරුම් කර ගැනීමට හැකි බව ප්‍රකාශ විය. පලදා වර්ධන කමිටු, ගොවි කාරක සභා සහ ග්‍රාමීය ආයතන වල වගකීම් සහ බලතල ආදිය පිළිබඳව පොලිස් නිලධාරීන් අතර නියමිත අවබෝධයක් ලබා දීම අතිශයින් ප්‍රයෝජනවත් මෙන් ම ඉතා වැදගත් කටයුත්තක් බවත් මෙය පලදා වර්ධන නීති අංශය විසින් ද කළයුතු බවත් ප්‍රකාශ විය.

මෙම ප්‍රදේශය මූලික වශයෙන් වී ගොවි තැනින් යැපෙන ජන කොටසක් ජීවත් වන ප්‍රදේශය කි. සාමාන්‍ය ගොවි මහතෙක් වුව ද සෑහෙන ප්‍රමාණයක් තමා විසින් නිෂ්පාදිත වී සමුපකාර සමිතියට අස්වැන්න නෙලන අවස්ථාවේ ඉදිරිපත් කරයි. මේ හේතුවෙන් සමුපකාර සමිති වලට වී මිළ දී ගැනීමේ, මැනීමේ, ගබඩා කිරීම, ප්‍රවාහනය කිරීම, මුදල් ගෙවීම ආදී කටයුතු ඉතා අපහසුවෙන් කළයුතු කාර්ය බහුල අවස්ථාවකට මුහුණ දෙන්නට සිදු වේ. බොහෝ විට මේ අවස්ථාවේ දී ගොවි මහත්-වරුන් විසින් තම වී විකුණා ගැනීමට දවස් ගණන් සමිතියේ ගබඩා අසල වී තබා ගෙන රැඳී සිටින්නට සිදු වේ. එවැනි අවස්ථාවල දී හොරකම් පවා සිදු වන බව පොලිසියට ද වාර්තා කොට ඇත. මෙසේ මහත් අපහසුවෙන් වී විකුණූ අනතුරුව ද මුදල් ලබා ගැනීමට සමහර විට කල් ගත වන බව පැවසේ. මෙවැනි අපහසුකම් මඟ හරවා ලීමට පලදා වර්ධන කමිටු විසින් ද වී මිළ දී ගැනීමට අවස්ථාවක් ලබා දෙන ලෙස කමිටුව ඉල්ලා සිටී. එවැනි වැඩ පිළිවෙලක් සකස් කළ හොත් ගොවි ණය අය කර ගැනීම පිළිබඳව ද, වැඩ පිළිවෙළ මීට වඩා පහසු වනු ඇතැයි ලංකා බැංකු ශාඛා නිලධාරියෙක් ද පලදා වර්ධන කමිටු උප සභාපති තැන ද පවසයි.

කෘෂි කර්ම උපදේශක මහතා පලදා වර්ධන කමිටුව සමඟ කිට්ටු සම්බන්ධයෙකින් කටයුතු කර යි. ඔහු පැවසූ අන්දමට මෙම කමිටු බල ප්‍රදේශය තුළ අක්කර 7168 ක වී වගා කෙරේ. මෙම මුළු බිම් ප්‍රමාණයම මාස් කන්නයේ දී වගා කරන අතර, යල් කන්නයේ දී වගා කරන්නේ මීට තරමක් අඩු අක්කර ප්‍රමාණයකි. වාරිමාර්ග ක්‍රම අනුව සලකා බලන විට මේ බිම් ප්‍රමාණයට ජලය ලබා ගන්නේ යට සඳහන් අයුරිනි.

**සටහන - 1**

| | | | |
|---|---|---|---|
| විශාල වාරි මාර්ග | - | අක්කර | 6874 |
| සුළු වාරි මාර්ග | - | අක්කර | 243 |
| වැසි දියෙන් | - | අක්කර | 51 |
| එකතුව | - | | 7168 |

මෙම කන්නය තුළ ප්‍රදේශයේ වගා කරන ලද අනෙකුත් බෝග පිළිබඳ විස්තර යට සඳහන් අයුරු ය.

**සටහන - 2**

| බෝගය | | අක්කර ගණන |
|---|---|---|
| මිරිස් | - | 1014 |
| රතුලූනු | - | 12 |
| ඉදල් ඉරිඟු | - | 73 |
| බඩ ඉරිඟු | - | 336 |
| මුං | - | 380 |
| කෝපි | - | 129 |
| රටකජු | - | 91 |
| කුරක්කන් | - | 356 |
| එකතුව | | 2391 |

කෘෂි කර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රදේශයේ ගොවීන් ගේ ප්‍රයෝජනය සඳහා මේ කන්නයේ නිකුත් කරන ලද බිත්තර වී ප්‍රමාණය මෙසේ ය.

**සටහන - 3**

| | | | |
|---|---|---|---|
| බීජී 11 | - | බුසල් | 440 |
| අයි ආර් 8 | - | බුසල් | 50 |
| බීජී 34 - 6 | - | බුසල් | 70 |
| බීජී 34 - 8 | - | බුසල් | 50 |
| අයි ආර් 2 - 262 | - | බුසල් | 20 |
| බීජී 92 | - | බුසල් | 4 |
| බීජී 94 - 1 | - | බුසල් | 4 |
| එකතුව | - | බුසල් | 638 |

මෙම ප්‍රදේශයේ වී අස්වැන්න සාමාන්‍යය අක්කරයකට 1973/74 මහ කන්නයේ දී බුසල් 62.6 ක් පමණ විය. කෘෂි කර්ම උපදේශක මහතා ගේ අදහස් අනුව ප්‍රදේශයේ ගොවීන් විසින් -

පොහොර භාවිතය 33% කින් පමණ අඩුවෙන් කරන ලද බව ප්‍රකාශ විය. පොහොර මිළ ඉහළ යාම මීට හේතුව වශයෙන් දක්වන ලදී.

**ලංකා බැංකු ශාඛාව**

අම්බලන්තොට කෘෂි සේවා මධ්‍යස්ථානයට සම්බන්ධ ලංකා බැංකු ශාඛාව 1973 ඔක්තෝබර් මාසයේ දී පිහිටුවන ලදී. පිහිට වූ දින සිට කන්න 3 ක් ඇතුළත ප්‍රදේශයේ ගොවි මහතුන්ට දෙන ලද ණය ප්‍රමාණයන් සහ ණය මුදල් ආපසු අය කර ගැනීම පිළිබඳ විස්තර යට සඳහන් අයුරු ය.

**සටහන - 4**

**අම්බලන්තොට කෘෂි සේවා මධ්‍යස්ථානයේ පිහිටි ලංකා බැංකු ශාඛාව විසින් දෙන ලද ණය හා ආපසු අය කර ගැනීම්**

| කන්න | ණය ලබා ගත් ගොවීන් ගණන | දෙන ලද ණය මුදල රුපියල් | ආපසු ගෙවීම් රුපියල් | හිඟ ඉතිරිය 31-12-74 රුපියල් |
|---|---|---|---|---|
| 73/74 මහ | 80 | 87075 | - | 8756 |
| 74 යල | 60 | 113106 | - | 10165 |
| 74/75 මහ | - | 402591 | - | - |

පළමු වන කන්නයේ දෙන ලද ණය ප්‍රමාණයට වඩා 30% ක් දෙවන කන්නයේ දෙන ලදී. මෙම මහ කන්නයේ දෙන ලද ප්‍රමාණය පළමු කන්නයේ දුන් ණය මෙන් 4 ගුණයක් පමණ බව පෙනේ. 1973 - 74 මහ කන්නයේ ද, 1974 යල කන්නයේ ද, දෙන ලද ණය වලින් අය කර ගැනීමට ඉතිරිව ඇත්තේ රු. 19,000කට කිට්ටු මුදලකි. මෙවර මහ කන්නයේ දෙන ලද ණය මුදල පිළිබඳ විග්‍රහය යට සඳහන් අයුරු ය.

**සටහන - 5**

**1974-75 මහ කන්නයේ කෘෂි කාර්මික ණය විග්‍රහය**

| | | රුපියල් |
|---|---|---|
| වී | - | 3,26,499 |
| මිරිස් | - | 49,452 |
| රතුලූනු | - | 10,655 |
| තවත් භෝග | - | 6,565 |
| කෘෂි කාර්මික යන්ත්‍ර සඳහා | - | 9,420 |
| එකතුව | - | 4,02,591 |

මෙම බැංකුවේ ණය ඉල්ලුම් පත් අනුමැතිය සඳහා තංගල්ල ශාඛාවට යැවේ. චෙක්පත් මගින් යවන ද්‍රව්‍ය සඳහා ගෙවීම් කරන විට එම චෙක්පත් අත්සන් කරනු ලබන්නේ ද තංගල්ලේ දී ය.

ලංකා බැංකු ණය ක්‍රමය පිළිබඳ ප්‍රචාරයක් පලදා වර්ධන කමිටුව මගින් දෙන ලදී. අසල පිහිටි වීරවිල පලදා වර්ධන කමිටුව මගින් ද, මෙම ශාඛාවෙන් තම බල ප්‍රදේශයේ ගොවීනට ණය මුදල් ලබා ගැනීම සඳහා පහසුකම් ලබා දී ඇති අතර, ඒ පිළිබඳ පුළුල් ප්‍රචාරයක් එම පලදා වර්ධන කමිටුව විසින් දෙන ලදී.

කෘෂි රසායන ද්‍රව්‍ය පලදා වර්ධන කමිටුවෙන් සහ ලංකා බැංකුවෙන් ණය ගත් ගොවීන් විසින් ලබා ගත යුතු අතර, ඒ සඳහා පුද්ගලික ආයතන වල විකුණුම් ගැනීමට වඩා සුළු මුදලක් වැඩියෙන් - ගෙවන්නට සිදු වන බව පැවසින. ලංකා බැංකුවෙන් ලබා ගන්නා ගොවි ණය ආපසු අය කර ගැනීම සඳහා වී මිලයට ගන්නා සමූපකාර සමිතිය සමඟ සම්බන්ධව සතස් තොට ගත් වැඩ පිළිවෙළක් දැනට නැති අතර, පලදා වර්ධන කමිටුවට ද වී මිළ දී ගැනීමේ බලය ලබා දෙන්නේ නම් මෙය ඉතා ප්‍රයෝජනවත් බව පැවසින.

ගත වූ වසර තුළ ගත් ණය වලින් රු. 11,000 ක් පමණ ලංකා බැංකු ශාඛාවට ගෙවීමට සිදු වී ඇති නමුත්, මෙම කන්නයේ සිට ලැබ ලබමින් සිටින බව දැන ගන්නට ඇත.

ගොවි ණය ආපසු ලබා ගැනීමේ දී මෙම ශාඛාව විසින් සැළකිය යුතු ගැටළු වලට මුහුණ පා ඇති බව පැහැදිලි ය. සමූපකාර සමිතිය වෙත තමා නිෂ්පාදනය කළ වී විකුණන ගොවි මහතුන් ලබා ගත් මුදල් වලින් කොටසක් ලංකා බැංකුවේ ණය ගෙවීම සඳහා යොදවන බව ප්‍රකාශ විය. කලාතුරකින් ගොවි මහතෙක් විශාල මුදලක් තම ගිනුමේ තැන්පත් කරන නමුත් බොහෝ දෙනෙක් එසේ නො කරන බවත් මුදල් ලබා ගත් විගස නොයෙක් දේ සඳහා වියදම් කරන බවත් දැන ගන්නට ලැබුණි. මෙම ප්‍රදේශයේ විවිධ සේවා සමූපකාර සමිතිය සහ ආශ්‍රිත ග්‍රාමීය බැංකුව විසින් දෙන ලද ණය පිළිබඳ යට සඳහන් විස්තර ලබා ගත හැකි විය.

**සටහන 6 යි**

**අම්බලන්තොට ග්‍රාමීය බැංකු ගොවි ණය**

| කන්නය | | දෙන ලද ගොවි ණය රුපියල් | ගොවීන් ගණන | ආපසු ගෙවූ මුළු ප්‍රමාණය රුපියල් |
|---|---|---|---|---|
| 1974/75 | මහ | 1163959.05 | 991 | - |
| 74 | යල | 873809.92 | 897 | 823657.26 |
| 1973/74 | මහ | 154931.50 | 335 | 41741.90 |
| | | 840588.12) | - | - |
| 1973 | යල | 141216.83) | - | 838061.42 |

ග්‍රාමීය බැංකුව විසින් දෙන මෙම ගොවි ණය සඳහා පළමු 7 මස තුළ 9% ක පොළියක් ද ඉන්පසුව 12% ක පොළියක් ද අය කරයි. ගොවි මහත්වරුන් ගේ ඉතිරියකිරීමේ ගිණුම් වල ඉතිරිය සඳහා 6% ක පොළියක් ද බැංකුව මගින් ගෙවනු ලැබේ. (ණය මුදල් ආකෘති පත්‍රයේ පිටපතක් මෙහි අමුණා ඇත.)

ප්‍රදේශයේ ගොවි මහත්වරුන් කිහිප දෙනෙක් සමඟ කථා කළ අවස්ථාවේ දී ප්‍රකාශ වුනු අදහසක් නම් ග්‍රාමීය බැංකු. ගොවි ණය සමූපකාර සමිති මගින් ලබා ගැනීමේ දී බොහෝ සමිති වල කටයුතු ප්‍රමාදව මෙන් ම අකාර්යක්ෂමව සිදු වන බව යි. එක් ගොවි මහතෙක් මෙසේ පැවසුවේ ය. "...... අපේ සමිතියේ නිලධාරීන් ගොවි ණය ලබා දීම ඕනෑකමින් ප්‍රමාද කරනවා. එහෙම කිරීමෙන් ඔවුන්ටත් ඔවුන් ගේ නෑ හිතවතුන්ටත් වාසි තියෙනවා. සමූපකාර කළමනාකාර වරුන් සහ සිය නෑදෑයන් ගම්වල සැළකිය යුතු ධනවත් පුද්ගලයන් ය. ඒ අය සමූපකාර සමිතියෙන් දෙන ණය ප්‍රමාද කොට ගොවියා අසහනකාරී අවස්ථාවකට පමුණුවා පුද්ගලිකව ණය දෙනවා. මෙහෙම ණය දීමේ දී කන්නය තුළ ලබා ගන්නා මුදල් වෙනුවෙන් කන්නය අවසානයේ දී ලොකු කුරුණියෙන් මැන වී ලබා ගන්නවා. වී අමුණක් සඳහා රජයෙන් ගෙවන මුදලටත් අඩු මුදලක් දෙන ඔවුන් ඒ සඳහා අමුණු 1 1/2 ටත් වඩා කන්නය අග දී ලබා ගන්නවා. .......".

මෙවැනි සමිති බහුල ලෙස මෙම ප්‍රදේශයේ ඇති බව කිහිප දෙනෙක් පවසන ලදී. උවමනා වෙන් හෝ තවත් නොයෙක් හේතු නිසා සමූපකාර සමිති මගින් ණය ලබා ගැනීමේ දී ප්‍රමාදයන්ට මුහුණ පෑමට ගොවි ජනතාවට සිදු වන බව කිහිප දෙනෙකු ගේ අදහස විය.

තවත් ගොවි මහතෙක් ගොවි තැනින් දැනට ඇති තත්වය යටතේ යැපීම අපහසු බව පවසන ලදී. "......රජය මගින් වී බුසලකට ගෙවන මුදල තරමක් වැඩි කළත් වගා කටයුතු වලට දැන් ඉස්සරට වැඩියෙන් ගොඩක් වියදම් වෙනවා. කුලී කරුවන්ට ගෙවන මුදල දැන් ඉස්සරට වැඩි යි. කෑම වේලකට යන වියදම ඉහළ යි. පොහොර වගේ ම බෙහෙත් වර්ග වලට වැඩි මුදලක් වැය වෙනවා. ට්‍රැක්ටර් කුලී ආදියත් සැර යි. මේ තත්වය යටතේ වී ගොවි තැනින් අපට ලැබෙන ආදායම මදි යි. ........".

1. සැවරි අධ්‍යයනයේ විස්තර ආශ්‍රයෙන් ලංකා බැංකු ශාඛාව ගොවීනට කරන සේවය පිළිබඳ ව අදහස් දක්වා මීට පුළුල් අන්දමින් සංවර්ධන කටයුතුවලට මැදිහත් විය හැක්කේ කෙසේ දැයි විමසන්න.
2. ඵලදා වර්ධන කමිටුව මගින් ප්‍රදේශයේ දියුණුවට වඩාත් කාර්යක්ෂම වැඩ කොටසක් කළ හැක්කේ නම් ඒ කෙසේ දැයි විස්තර කරන්න.

## අම්බලන්තොට පලදා වර්ධන කමිටුවෙන් කරන ලද

# නි වේ ද න ය යි.

හැම කෘෂිකාර්මික ඉඩමකම ඒවායින් උපරිම නිෂ්පාදනයක් ලබා පලදා වර්ධනය සැලසීමේ අදහසින් නිසි ලෙස ආහාර බෝග වගා කිරීම ඉඩම් හිමියන්ගේ හා ඉඩම් පරිහරණය කරන්නන්ගේ නීතිමය යුතුකම වේ.

**පලදා වර්ධන නීතියේ 2 වගන්තිය:-**

ඉඩම් හිමියෙක් සුපරීක්ෂක යුතුකම ඉටු නොකරන විට ඔහුගේ ඉඩම් රජයට පවරා ගැනීමටත්, ඉඩම් පරිහරණය කරන්නෙක් සුපරීක්ෂක යුතුකම ඉටු නොකරන විට පලදා වර්ධන කමිටුවට දැනුම් දී අනුව ඔහුගේ අයිතිය අහෝසි කර දීමටත් පුළුවන් වේ

**පලදා වර්ධන නීතියේ 7 වගන්තිය හා 1, 2, 3, 4 යන උප වගන්තිය -**

තවද ඉහත කී නීතිමය යුතුකම් ඉටු නොකරන ඉඩම් හිමියන් හා ඉඩම් පරිහරණය කරන්නන් මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියට පැමිණවීමෙන් නඩු පවරා වැරදි කරුවන් වූවිට ඔවුන්ට සිරදඬුවම් විඳීමට ද සිදුවේ

**පලදා වර්ධන නීතියේ 4 හා 42 යන වගන්තිය -**

ආහාර අතින් ස්වයංපෝෂිත වූ ස්වාධීන ලාංකික ජනතාවක් උදෙසා නායකත්වයට පිළිතුරු අදහසින් ගොවි ඇති ඉහත කී පලදා වර්ධන නීති ගැන කරුණු සැලකිල්ලට ගෙන වගා කළ හැකි සියළුම කොටස් ඉඩම් හා කුඹුරු කඩිනමින් වගා කරන ලෙස ඉඩම් හිමියන් හා ඉඩම් පරිහරණය කරන්නන්ට කාරුණිකව නිවේදනය කරමු.

තවද අද කුඹුරුවල හා ඉඩම් හිමි කුඹුරු වලට ජල පහසුව ලබා ගන්නා ඇළ මාර්ග නිසියාකාරව සකස් කර ජලය ලබා ගැනීමට හා වගා කිරීමට හැකිවන පරිදි පිරිසිදු කිරීම් මාදගත් කාරියක් වන අතර එය උම්මානයෙන් පැහැර හැර තිබෙයි ඒ සඳහා පියවරක් ගැනීම පිණිස දඬුවම් ලැබීමට සිදුවන බවද මෙයින් දන්වමු

1974/75 ... ... ... කන්නයට තම ගොවි ඉඩම් වල අතිරේක බෝග වගා කිරීම සඳහා මේ දක්වා කටයුතු නොකර ඇති ඉඩම් පලදා වර්ධන කමිටුව විසින් ලැයිස්තු ගත කර ඇති වගා කිරීම සඳහා ලබා දීමට අම්බලන්තොට කෘෂිකර්ම සභාපති / පලදා වර්ධන කමිටුවට ඉක්මනින්ම සිදුවන බව මෙයින් නිවේදනය කරමි.

තව දුරටත් ඉඩම් හිමි කුඹුරු හිමියනුත්, අද ගොවිතැනුත්, එම කුඹුරු අස් අඳ බදුදීම, කුඹුරු හිමියන් වශයෙන් ... කුඹුරු හා ඉඩම් ... හා රජයේ පලදා වර්ධන නීති රීති සම්බන්ධ ඉඩම් අයිතිය ... බලය තිබේ. තවද පලදා වර්ධන කමිටුව අනුව මේ ගැන කටයුතු කරන අතර දඬුවම් විඳීමට සිදුවන බවද සඳහන් කරමි.

**පලදා වර්ධන කමිටුව**

**සභාපති**

**අම්බලන්තොට.**